S - 02
686112

07 FEB 2026

# ජාතික පොලිස් කොමිෂන් සභාව
# தேசிய பொலிஸ் ஆணைக்குழு
# National Police Commission


අංක 9 ගොඩනැගිල්ල, B.M.I.C.H. පරිශ්‍රය, බෞද්ධාලෝක මාවත, කොළඹ
9 ஆம் இலக்கக் கட்டிடம், B.M.I.C.H. வளாகம், பௌத்தாலோக மாவத்தை, கொழும்பு
Block No. 9, B.M.I.C.H. Premises, Bauddhaloka Mawatha, Colombo


මගේ අංකය / எனது இல. / My No. NPC/ED/01/04/NGO(SI)-SOR
ඔබේ අංකය / உமது இல. / Your No. PHQ/EP &SORP/10/06/2025
දිනය / திகதி / Date 2026.02. 06

COMM - E
IN - 1345
10 FEB 2026
OUT -

පොලිස්පති
පොලිස් මූලස්ථානය
කොළඹ 02.

**ශ්‍රී ලංකා පොලිසියේ පොලිස් හා නියාමන සේවා ගණය සඳහා වන බඳවාගැනීමේ පටිපාටියට (උප පොලිස් පරීක්ෂක) අදාළ සංශෝධන අනුමත කරවා ගැනීම**

ඉහත කරුණ සම්බන්ධයෙන් ඔබගේ අංක PHQ/EP &SORP/10/06/2025 හා 2026.02.04 දිනැති ලිපිය හා බැඳේ.

02. එමගින් 2026.01.22 වන දින පැවති ජාතික පොලිස් කොමිෂන් සභා රැස්වීමේ දී අනුමත කරන ලද සංශෝධන ද ඇතුළත්ව ඔබ විසින් එවා තිබූ ශ්‍රී ලංකා පොලිසියේ පොලිස් හා නියාමන සේවා ගණය සඳහා වන බඳවාගැනීමේ පටිපාටියෙහි (උප පොලිස් පරීක්ෂක) මවිසින් අත්සන් කරන ලද පිටපත් 05ක් අවශ්‍ය කටයුතු සඳහා මේ සමඟ එවමි.

03. ඒ අනුව මෙම බඳවා ගැනීමේ පටිපාටිය සම්බන්ධයෙන් සියළුම නිලධරයන් දැනුවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන ලෙසත්, ඒ අනුව ඔබ විසින් නිකුත් කරනු ලබන ආර්.ටී.එම්. පණිවිඩයේ පිටපතක් ජාතික පොලිස් කොමිෂන් සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලෙසත් ජාතික පොලිස් කොමිෂන් සභාවේ නියමය පරිදි වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

තනුජා එන්. ප්‍රනාන්දු
ලේකම්
ජාතික පොලිස් කොමිෂන්

පිටපත : ලේකම්, මහජන පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය - ඔබගේ අංක 02/24/05/02/2025 හා 2026.02.05වන දිනැති ලිපිය සම්බන්ධයෙන් කරු. දැ.ගැ.ස.

## ශ්‍රී ලංකා පොලිසියේ පොලිස් හා නියාමන සේවා ගණයේ තනතුරු සඳහා වන සංශෝධිත බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය
## (උප පොලිස් පරීක්ෂක)

ජාතික පොලිස් කොමිෂන් සභාව තැපෑල වේලාව 05 FEB 2026

**1. සම්බන්ධ වන ආයතන :**

1.1. දෙපාර්තමේන්තුව : ශ්‍රී ලංකා පොලිසිය — යොමු අංකය:PHQ/ER06/38/2018 — දිනය:2018.09.27
නව යොමු අංකය:PHQ/EP&SORP/10/06/2025 — දිනය:2026.02.04

1.2. අමාත්‍යාංශය : අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු සහ ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය — යොමු අංකය:02/08/02/03/15(තාව) — දිනය:2020.12.04
මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය — නව යොමු අංකය:02/24/05/02/2025 — දිනය:2026.02.

1.3. කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම : — යොමු අංකය: DMS/1184 — දිනය: 2015.02.27
DMS/1184/Vol-V — 2019.10.14

1.4. ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය : — යොමු අංකය: EST-2/RECRU/06/5957 — දිනය: 2019.12.23
නව යොමු අංකය: EST-2/RECRU/06/5957 — දිනය: 2025.07.15

1.5. ජාතික වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශය : — යොමු අංකය: NSCC/06/43/61/SR-II(කා.II) — දිනය: 2019.04.17

1.6. ජාතික පොලිස් කොමිෂන් සභාවේ අනුමැතිය: — යොමු අංකය:NPC/ED/NGO/06/SOR/07/2020(Vol I,II,III) — දිනය:2020.10.23
නව යොමු අංකය:NPC/ED/01/04/NGO(SI)-SOR — දිනය:2026.01.22

**2. පත්කිරීමේ බලධරයා** : ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් බලය පවරන ලද පොලිස්පති

**3. සේවා ගණය පිළිබඳ විස්තර :**

3.1. සේවා ගණය : පොලිස් හා නියාමන සේවා

3.2. ශ්‍රේණි : අදාළ නොවේ.

3.3. පැවරෙන කාර්යභාරය පිළිබඳ පොදු නිර්වචනය : නීතිය හා සාමය සුරකිමින් මහජන ආරක්ෂාව සැලසීම.

3.4. කාර්යයන් පැවරීම : තනතුරු අනුව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර, මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාවය පදනම් කොට ගෙන ඕනෑම තනතුරක නිලධරයෙකුට පොලිස්පති විසින් පවරනු ලැබිය හැක.

4. තනතුරෙහි/ තනතුරුවල ස්වභාවය : ස්ථිර විශ්‍රාම වැටුප් සහිත.
(විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය.)

5. වැටුප :

5.1. වැටුප් කේත අංකය :

| | | |
|---|---|---|
| උප පොලිස් පරීක්ෂක | : | RS 3 -2025 |
| පොලිස් පරීක්ෂක | : | RS 4 -2025 |
| ප්‍රධාන පොලිස් පරීක්ෂක | : | RS 5 -2025 |

5.2. මාසික වැටුප් පරිමාණය:

| | | |
|---|---|---|
| උප පොලිස් පරීක්ෂක | : | රු. 55,410-7x670-2 x890-25x1,190-91,630 |
| පොලිස් පරීක්ෂක | : | රු. 63,070-24x1,190-91,630 |
| ප්‍රධාන පොලිස් පරීක්ෂක | : | රු. 72,800-17x1,400-96,600 |

5.3. ශ්‍රේණි ක්‍රමය හා ශ්‍රේණි ක්‍රම්යට අදාළ මාසික වැටුප් පියවර : අදාළ නොවේ.

6. සේවා ගණයට අයත් තනතුර/ තනතුරු :

6.1. අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව සහ එම තනතුරුවලට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාම | අනුමත තනතුරු සංඛ්‍යාව | තනතුරුවලට පැවරෙන කාර්යයන් |
|---|---|---|
| **i. උප පොලිස් පරීක්ෂක** | | ඇමුණුම I හි දක්වා ඇති කාර්යයන් |
| උප පොලිස් පරීක්ෂක | 5312 | |
| කාන්තා උප පොලිස් පරීක්ෂක | 642 | |
| උප පොලිස් පරීක්ෂක (වි.කා.බ.) | 812 | |
| කාන්තා උප පොලිස් පරීක්ෂක (වි.කා.බ.) | 13 | |
| **ii. පොලිස් පරීක්ෂක** | | |
| පොලිස් පරීක්ෂක | 2699 | |
| කාන්තා පොලිස් පරීක්ෂක | 266 | |
| පොලිස් පරීක්ෂක (වි.කා.බ.) | 270 | |
| කාන්තා පොලිස් පරීක්ෂක (වි.කා.බ.) | 07 | |
| **iii. ප්‍රධාන පොලිස් පරීක්ෂක** | | |
| ප්‍රධාන පොලිස් පරීක්ෂක | 780 | |
| කාන්තා ප්‍රධාන පොලිස් පරීක්ෂක | 66 | |
| ප්‍රධාන පොලිස් පරීක්ෂක (වි.කා.බ.) | 67 | |
| කාන්තා ප්‍රධාන පොලිස් පරීක්ෂක (වි.කා.බ.) | 02 | |

6.2. ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : අදාළ නොවේ.

## 7. බඳවා ගැනීමේ ක්‍රමය :

උප පොලිස් පරීක්ෂක තනතුර සඳහා බඳවා ගන්නා සියළුම අයදුම්කරුවන්/ අයදුම්කාරියන් මෙම බඳවා ගැනීමේ පටිපාටියට අදාළ වේ.

7.1. බඳවා ගන්නා ප්‍රතිශතයන් :

| ධාරාව | ප්‍රතිශතය | |
|---|---|---|
| | සාමාන්‍ය සේවය | වි.කා.බ. |
| විවෘත | 40% | 50% |
| ජ්‍යෙෂ්ඨතාවය | 25% | 20% |
| සීමිත තරඟ විභාග | 15% | 10% |
| කුසලතාව | 20% | 20% |

7.2. විවෘත බඳවා ගැනීම

7.2.1. බඳවා ගන්නා තනතුර : උප පොලිස් පරීක්ෂක/ කාන්තා උප පොලිස් පරීක්ෂක/ උප පොලිස් පරීක්ෂක (වි.කා.බ.)/ කාන්තා උප පොලිස් පරීක්ෂක (වි.කා.බ.)

7.2.2. සුදුසුකම් :

7.2.2.1. අධ්‍යාපන සුදුසුකම් :

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් මාධ්‍ය භාෂාව සහ ගණිතය යන විෂයයන් ඇතුළුව සම්මාන සාමාර්ථ හතරක් සහිතව එක් වරකදී විෂයන් හයක් සමත් වීම හා ඉංග්‍රීසි භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම. (ඉංග්‍රීසි භාෂාව සඳහා සම්මානය වෙනත් අවස්ථාවකදී ලබා තිබීම සලකා බලනු ලැබේ.)

සහ

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයෙන් එක් වරකදී විෂයන් තුනකින් සමත් වී තිබීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර)

සටහන 01 : ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විෂය වර්ගීකරණය අනුව විෂයය අංක 41, 44 දරණ විද්‍යා විෂය යුගලය එක් විෂයයක් ලෙසද, අංක 42 සහ 45 දරණ ගණිතය විෂය යුගලය එක් විෂයයක් ලෙසද සලකා විභාගයෙන් සමත් විෂයයන් සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

සටහන 02 : අ.පො.ස. (සා/පෙළ) විභාගයේ තාක්ෂණ විෂය ලිඛිත පරීක්ෂණයෙන් අසමත්වීම එම විෂයයේ ප්‍රයෝගික පරීක්ෂණය සමත් වුවද එම විෂය අසමත් ලෙස සලකනු ලැබේ.

සටහන 03 : වෛකල්පිත දෙමළ, ඉංග්‍රීසි සහ සිංහල විෂය අ.පො.ස. (සා/පෙළ) විෂය ධාරාවට ඇතුළත් නොවන හෙයින් එම විෂයයන් සමත්වීම අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් සමත් විෂයයක් ලෙස ගණනය කරනු නොලැබේ.

7.2.2.2. වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ.

7.2.2.3. පළපුරුද්ද : අදාළ නොවේ.

7.2.2.4. කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

7.2.2.5. වෙනත් :

i. ශ්‍රී ලංකා පුරවැසියෙකු වීම.

ii. අයදුම්කරුවන්/ අයදුම්කාරියන් අයහපත් චරිතයකින් යුක්ත නොවීම.

iii. අවිවාහක විය යුතුය.

iv. දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

v. උස :- පිරිමි අවම වශයෙන් අඩි 05 අඟල් 06 හෝ වැඩිවිය යුතුය.
කාන්තා අවම වශයෙන් අඩි 05 අඟල් 04 හෝ වැඩිවිය යුතුය.

vi. පපුව :- පිරිමි - අවම වශයෙන් හුස්ම නාල්ලා අඟල් 32 ක් විය යුතුය.
(මෙය කාන්තා අයදුම්කරුවන්ට අදාළ නොවේ.)

vii. උපැස් යුවලක් හෝ ස්පර්ශ කාච නොමැතිව එක් එක් ඇසෙහි අවම දෘෂ්ටිය 6/12 ට අඩු නොවිය යුතුය. එක් ඇසක දෘෂ්ටිය 6/6ක් වන විට අනික් ඇසෙහි 6/18ක් විය යුතුය.

viii. පොලිස් සේවයේ ගරුත්වයට නොගැලපෙන හා රාජකාරිවලට බාධා වියහැකි අන්දමේ කෘත්‍රිම ශාරීරික වෙනස්කම් කර නොතිබිය යුතුය.

ix. අයදුම්කරුගේ සමීප ඥාතීන් (මව, පියා, භාරකරු, සමීපව සම්බන්ධතා පවත්වන අවිවාහක හෝ විවාහක සහෝදරයන්/ සහෝදරියන් සහ ඔවුන්ගේ කලත්‍රයන්) අපරාධ වරදකට වරදකරුවී නොතිබීම.

සටහන 01 : තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 7.2.2 සිට 7.2.3 දක්වා සුදුසුකම් සම්පූර්ණ කළ යුතු අතර, අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ ගැසට් පත්‍රයේ/ වෙබ් අඩවියේ සඳහන් දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු අතර, 7.2.2.4 හා 7.2.2.5 හි සුදුසුකම් බඳවා ගන්නා දිනට ද ඒ ආකාරයෙන් ම තිබිය යුතුය. **(බඳවා ගැනීම සඳහා වන ආදර්ශ අයදුම්පත්‍රය - ඇමුණුම II)**

සටහන 02 : ඉහත පරිපාටින්ට පරිබාහිරව පොලිස් රාජකාරී හෝ ජාත්‍යන්තර මට්ටමේ, ජාතික මට්ටමේ හෝ විශිෂ්ට ක්‍රීඩා කෞශල්‍යයකින් යුක්ත වූ හෝ වෙනත් ක්ෂේත්‍රයකින් සුවිශේෂ දක්ෂතා හෝ ප්‍රවීණතා පෙන්නුම් කර ඇති අයදුම්කරුවකුගේ/ අයදුම්කාරියකගේ උස සහ පපුව පිළිබඳ සුදුසුකම් නොසලකා අනෙක් සුදුසුකම් සපුරා ඇත්නම් පත්කිරීමේ බලධරයාගේ අභිමතය පරිදි බඳවා ගත හැකිය.

7.2.3. වයස :

7.2.3.1. අවම සීමාව : අවුරුදු 18 ට නොඅඩු
7.2.3.2. උපරිම සීමාව : අවුරුදු 25

සටහන - පොලිස් සේවයේ නියුතු නිලධාරියෙකු විවෘත බඳවා ගැනීම් සඳහා අයදුම්කරන්නේ නම් උපරිම වයස් සීමාව අවුරුදු **28** කි.

7.2.4. බඳවා ගැනීමේ ක්‍රමය :

I. **මූලික පරීක්ෂණය :** අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන්/ අයදුම්කාරියන් අතරින් සුදුසුකම් සහ වයස සපුරා ඇති අයදුම්කරුවන්/ අයදුම්කාරියන් පමණක් මූලික පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. එම පරීක්ෂණයේදී ඉහත 7.2.2 සිට 7.2.3 දක්වා වූ සුදුසුකම් (7.2.2.4 සහ 7.2.2.5 ඡේද VII සහ VIII හැර) පරීක්ෂා කර බලනු ලැබේ.

II. **ඔරොත්තු දීමේ පරීක්ෂණය :** මූලික පරීක්ෂණයට පෙනී සිටින අයදුම්කරුවන්/ අයදුම්කාරියන් පොලිස්පති විසින් පත්කරන මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ඔරොත්තුදීමේ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. අයදුම්කරුවන්/ අයදුම්කාරියන් විසින් ඔරොත්තු දීමේ පරීක්ෂණයට මුහුණ දීමට නුසුදුසු නොවන බවට කැඳවීම් ලිපිය සමඟ අමුණා එවනු ලබන පෝරමය ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරයෙකුගේ නිර්දේශ සහිතව එම අවස්ථාවේදී ඉදිරිපත් කළ යුතුය. **(ඇමුණුම III)**

| ක්‍රියාකාරකම | කාලය | ලකුණු |
|---|---|---|
| දුර දිවීම මීටර්/Run meters 1000 | විනාඩි 03 ට අඩුනම් | 30 |
| | විනාඩි 03 ත් 04 ත් අතර | 20 |
| | විනාඩි 04 ත් 05 ත් අතර | 10 |
| | විනාඩි 05 ට වැඩි නම් | අසමත් |
| Chinup (වාර 05 ක්) | විනාඩි 01 යි. | එක් වාරයකට ලකුණු 03 බැගින් උපරිම ලකුණු 15 කි |
| Pushup (වාර 15 ක්) | විනාඩි 01 යි. | වාරයකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 15 කි |
| Situp (වාර 15 ක්) | විනාඩි 01 යි. | වාරයකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 15 කි |
| Squat Thrust (වාර 15 ක්) | විනාඩි 01 යි. | වාරයකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 15 කි |
| Kim Gem (මතකය පරීක්ෂා කිරීම) | අයිතමයන් නිරීක්ෂණය කිරීම සඳහා තත්පර 30 යි. ධාරණය කර ගැනීමට තත්පර 30 යි. ලිවීමට තත්ත්පර 120 යි | එක් අයිතමයකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 10 යි |

සටහන **01 :** මතකය පරීක්ෂා කිරීම සඳහා අයදුම්කරුවන් අසුන් ගැනීමට සලස්වා ඉදිරියෙන් දර්ශන තිරයක් මත අයිතම 10 ක් පෙන්නුම් කර එය තත්පර 30 ක කාලයක් නිරීක්ෂණය කිරීමට අවස්ථාව දෙනු ලැබේ. ඉන් පසුව දර්ශනය ඉවත් කර තවත් තත්පර 30 ක් ධාරණය කර ගැනීමට අවස්ථාව දිය යුතුය. පසුව එම අයිතම 10 හි නාමයන්, ලබාදෙන කොලයේ සටහන් කිරීමට තත්පර 120 ක කාලයක් ලබාදිය යුතුය. (එදිනෙදා ජන ජීවිතයේදී භාවිතයට නොගන්නා අයිතමයන් භාවිතා කළ යුතු අතර, කණ්ඩායමෙන් කණ්ඩායමට අයිතම සහිත දර්ශන වෙනස් විය යුතුය)

සටහන **02:**

I. මීටර් 1000 ක දුරක් විනාඩි 05 ක කාලයක දී දිවීමට අසමත් වන අයදුම්කරුවන් යෝග්‍යතා පරීක්ෂණයෙන් අසමත් ලෙස සලකනු ලැබේ.

II. සාමාන්‍ය පොලිස් සේවය සඳහා බඳවා ගැනීමේදී ඉහත අභ්‍යාස වලින් මුළු ලකුණු 50% ක් ද පොලිස් විශේෂ කාර්ය බලකායට බඳවා ගැනීමේදී ඉහත අභ්‍යාස වලින් මුළු ලකුණු වලින් 60% ක්ද යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් කඩඉම් ලකුණු ප්‍රමාණය ලෙසට සලකනු ලැබේ.

සටහන **03:** ඔරොත්තු දීමේ පරීක්ෂණය පවත්වා අවසන් වීමෙන් පසු ඉන් සමත් වන අයදුම්කරුවන්/ අයදුම්කාරියන් සඳහා ලිඛිත විභාගය පවත්වනු ලැබේ.

7.2.4.1. ලිඛිත විභාගය :

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 01. අවබෝධය හා භාෂා හැකියාව | 100 | 40 |
| 02. සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය | 100 | 40 |

විභාග නිර්ණායක සහ විෂය නිර්දේශය ඇමුණුම **IV** හි වේ.

7.2.4.1.1. විභාගය පවත්වන බලධරයා : පොලිස්පති විසින් බලය පවරන ලද නිලධරයා

7.2.4.2. වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ.

7.2.4.3. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ.

7.2.4.4. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය : ලිඛිත පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන්/ අයදුම්කාරියන් අතරින් වැඩිම ලකුණු ලබාගත් අයදුම්කරුගේ සිට අවරෝහණ ක්‍රමයට සකස් කෙරෙන ප්‍රමුඛතා ලේඛනය අනුව, බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව මෙන් 5 ගුණයක් (1:5 අනුපාතයට) පමණක් අවසන් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 15 | 40 |
| 2. වෘත්තිය සුදුසුකම් | 15 | |
| 3. භාෂා හැකියාව | 10 | |
| 4. ක්‍රීඩා කුසලතා | 20 | |
| 5. නායකත්වය / ප්‍රජා සේවාවන් | 20 | |
| 6. සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය | 20 | |
| එකතුව | **100** | |

නිර්ණායක සහ ලකුණු ලබාදීමේ පටිපාටිය ඇමුණුම **V** හි වේ.

7.2.4.4.1. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා : ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් බලය පවරන ලද පොලිස්පති.

7.2.4.5. පසුබිම් පරීක්ෂණය :

7.2.4.5.1. ලිඛිත විභාගයෙන් සහ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණු සංඛ්‍යාව එකතු කොට අයදුම්කරුවන් ලබාගත් මුළු ලකුණු සංඛ්‍යාව අවරෝහණ ක්‍රමයට සකස් කරනු ලැබේ. එම ලකුණු අනුපිළිවෙල අනුව පුරප්පාඩු සංඛ්‍යාව මෙන් 125% ක අයදුම්කරුවන් ගණනක් පසුබිම් පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

7.2.4.5.2. අයදුම්කරුවන්ගේ අයහපත් චරිතය අනාවරණය කර ගැනීම සඳහා ඔහු/ ඇය හා ඔහුගේ/ ඇයගේ සමීප ඥාතීන්ගේද, ඔහු/ ඇය සමීපව ඇසුරු කරන්නන්ගේ ද අයහපත් චරිතය හා හැසිරීම සම්බන්ධව අයදුම්කරු පදිංචි පොලිස් ස්ථානය, පොලිස් විශේෂ කාර්යාංශය හා රාජ්‍ය බුද්ධි සේවය මගින් බුද්ධි හා ආවේක්ෂණ වාර්තා කැඳවනු ලබන අතර, එහිදී අයහපත් පසුබිම් වාර්තා සහිත අයදුම්කරුවන් නුසුදුස්සන් සේ සලකනු ලැබේ.

සටහන 01 : අයදුම්කරුගේ අයහපත් වාර්තා යන්නට අයදුම්කරුගේ හා සමීප ඥාතීන්ගේ ද සමීපව ඇසුරු කරන්නන්ගේ ද අපරාධ වාර්තා සහ වෙනත් අයහපත් හැසිරීම් හා චර්යාවන් ද සමාජ විරෝධි ක්‍රියාවන් සහ පොලිස් සේවයට නුසුදුසු වන අන්දමේ සම්බන්ධතා ද ඇතුළත් වේ.

සටහන 02 : සමීප ඥාතීන් යන්නට අයදුම්කරුගේ/ අයදුම්කාරියගේ මව, පියා, භාරකරු, අවිවාහක සහෝදරයන්/ සහෝදරියන් ද සමීපව සම්බන්ධතා පවත්වන විවාහක සහෝදරයන්/ සහෝදරියන් සහ කලත්‍රයන්ද ඇතුළත් වේ.

සටහන 03 : අයදුම්කරුවෙකුගේ අයහපත් පසුබිම් වාර්තා මත ඔහු හෝ ඇය බඳවා ගැනීම සඳහා සුදුසු/ නුසුදුසු වන්නේද යන වග තීරණය කිරීම පත් කිරීම් බලධරයා විසින් කළ හැකිය.

7.2.4.6. වෛද්‍ය පරීක්ෂණය :

7.2.4.6.1.

i. වෛද්‍ය පරීක්ෂණය සඳහා තෝරාගත් අයදුම්කරුවන්/ අයදුම්කාරියන් විසින් පොදු 169 පෝරමය සම්පූර්ණ කර පොලිස් රෝහල වෙත ඉදිරිපත් කළ යුතුය.

ii. මෙහිදී අයදුම්කරුවන්/ අයදුම්කාරියන් පොලිස් රාජකාරි ඉටු කිරීම සඳහා සුදුසු බවට සහ ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක රාජකාරි කිරීමට සුදුසු බවට ශාරීරික හා මානසික යෝග්‍යතාව සම්බන්ධයෙන් වෛද්‍ය පරීක්ෂණයකට ද භාජනය කරනු ලැබේ.

iii. එම අයදුම්කරුවන්/ අයදුම්කාරියන් පොලිස් රෝහල විසින් පවත්වනු ලබන අදාළ වෛද්‍ය පරීක්ෂණයෙන් සමත්විය යුතුය.

iv. සම්පූර්ණ කරන ලද සෞඛ්‍ය 169 පෝරමය සහ **ඇමුණුම VI** හි දක්වා ඇති ශ්‍රී ලංකා පොලිසියේ පූර්ව පත්වීම් වෛද්‍ය ඇමුණුම, වෛද්‍යවරයාගේ නිර්දේශය ද සහිතව පොලිස්පති වෙත ඉදිරිපත් කළ යුතුය.

v. සෞඛ්‍ය 169 පෝරමය සහ ඇමුණුම VI යන වෛද්‍ය වාර්තා දෙක මගින්ම යෝග්‍යතාවය තහවුරු කරන අයදුම්කරුවන්/ අයදුම්කාරියන් පමණක් පවතින පුරප්පාඩු මත බඳවා ගැනීම සඳහා සලකා බලනු ලැබේ.

vi. වෛද්‍ය පරීක්ෂණයට භාජනය විය හැක්කේ එක් වරක් පමණි.

7.2.5. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් පළ කිරීම සහ වෙබ් අඩවියේ දැන්වීම් පළ කිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**7.3. සීමිත බඳවා ගැනීම:**

7.3.1. බඳවා ගන්නා තනතුර : උප පොලිස් පරීක්ෂක/ කාන්තා උප පොලිස් පරීක්‍ෂක/ උප පොලිස් පරීක්‍ෂක (වි.කා.බ.)/ කාන්තා උප පොලිස් පරීක්‍ෂක (වි.කා.බ.)

7.3.2. සුදුසුකම්

7.3.2.1. අධ්‍යාපන සුදුසුකම් :අදාළ නොවේ.
7.3.2.2. වෘත්තීය සුදුසුකම් :අදාළ නොවේ.
7.3.2.3. පළපුරුද්ද :අදාළ නොවේ.
7.3.2.4. කායික සුදුසුකම් :අදාළ නොවේ.

7.3.2.5. වෙනත් :

7.3.2.5.1. පොලිස් මහ සැරයන් සහ පොලිස් සැරයන් තනතුරේ සිට උප පොලිස් පරීක්ෂක තනතුරට බඳවා ගැනීම.

**සපුරාලිය යුතු සුදුසුකම්.**

(i) දෙවන කාර්යක්ෂමතා කඩඉම සමත් වී තිබීම.

(ii) පොලිස් සැරයන් තනතුරට පත්වීමෙන් පසු අවම වශයෙන් වසර 03 ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සහ පොලිස් සේවයේ වසර 10 ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(iii) විශේෂ වැටුප් වර්ධක හැර වැටුප් වර්ධක 10ක් උපයාගෙන තිබීම.

(iv) අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටියට අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර 10 ක් තුල සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

(v) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූලව දඬුවමක් ලබා නොතිබිය යුතුය.

(vi) අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා තිබීම.

හෝ

7.3.2.5.2. පොලිස් කොස්තාපල් හෝ / පොලිස් සැරයන්/ මහ සැරයන් තනතුරේ උසස් පෙළ සමත් නිලධරයන් උප පොලිස් පරීක්ෂක තනතුරට බඳවා ගැනීම.

**සපුරාලිය යුතු සුදුසුකම්.**

(i) පොලිස් කොස්තාපල් තනතුරෙහි ස්ථිර කර තිබීම.

(ii) අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයෙන් එක් වරක දී විෂයන් තුනෙන්ම සමත්ව තිබීම සහ පොලිස් සේවයෙහි වසර 10ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(iii) විශේෂ වැටුප් වර්ධක හැර වැටුප් වර්ධක 10 ක් උපයාගෙන තිබීම.

(iv) අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටියට අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර 10 ක් තුල සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

(v) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූලව දඬුවමක් ලබා නොතිබිය යුතුය.

(vi) අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා තිබීම.

හෝ

7.3.2.5.3. පොලිස් කොස්තාපල් හෝ පොලිස් සැරයන් හෝ මහ සැරයන් තනතුරේ උපාධිධාරී නිලධරයන් උප පොලිස් පරීක්ෂක තනතුරට බඳවා ගැනීම.

**සපුරාලිය යුතු සුදුසුකම්.**

(i) පොලිස් කොස්තාපල් තනතුරෙහි ස්ථිර කර තිබීම.

(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ආයතනයකින් උපාධියක් ලබා තිබීම සහ පොලිස් කොස්තාපල් තනතුරෙහි වසර 05 ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(iii) විශේෂ වැටුප් වර්ධක හැර වැටුප් වර්ධක 05ක් උපයාගෙන තිබීම.

(iv) අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටියට අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර 05 ක් තුල සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

(v) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූලව දඬුවමක් ලබා නොතිබිය යුතුය.

(vi) අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා තිබීම.

7.3.3. වයස

7.3.3.1. අවම සීමාව : අදාළ නොවේ
7.3.3.2. උපරිම සීමාව : අදාළ නොවේ

7.3.4. බඳවා ගැනීමේ ක්‍රමය

7.3.4.1. ලිඛිත විභාගය :

| විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| නීතිය | 100 | 40 |
| පොලිස් නියෝග හා ප්‍රායෝගික පොලිස් විධි | 100 | 40 |
| සාමාන්‍ය දැනීම සහ බුද්ධි පරීක්ෂණය | 100 | 40 |

විභාග නිර්ණායක සහ විෂය නිර්දේශය : ඇමුණුම **VII** හි වේ.

7.3.4.1.1. විභාගය පවත්වන බලධරයා : පොලිස්පති විසින් බලය පවරන ලද නිලධරයා

7.3.4.2. වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ.

7.3.4.3. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ.

7.3.4.4. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය :

| අනු අංකය | ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂය | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීම සඳහා සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | අමතර අධ්‍යාපන සුදුසුකම් | 15 | අදාළ නොවේ |
| 02 | විශිෂ්ට දක්ෂතා | 20 | |
| 03 | ක්‍රීඩා | 10 | |
| 04 | පාඨමාලා | 20 | |
| 05 | වෘත්තීය ප්‍රවීණතා | 15 | |
| 06 | පදක්කම් | 10 | |
| 07 | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය | 10 | |
| මුළු ලකුණු | | **100** | |

නිර්ණායක සහ ලකුණු ලබා දීමේ පටිපාටිය : ඇමුණුම **VIII** හි වේ.

7.3.4.4.1. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා : ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් බලය පවරන ලද පොලිස්පති.

7.3.4.4.2. තෝරා ගැනීම : සීමිත තරඟ විභාගයෙන් ලබා ගන්නා මුළු ලකුණු සංඛ්‍යාවට යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයෙන් ලබා ගන්නා මුළු ලකුණු එකතු කර, අයදුම්කරුවන්ගේ ලකුණු අවරෝහණ ක්‍රමයට සකස් කර පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව ලකුණු ප්‍රමුඛතා අනුපිළිවෙලට සුදුස්සන් තෝරාගනු ලැබේ.

7.3.5. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය: ශ්‍රී ලංකා පොලීසිය තුළ දෛනික දුරකථන පණිවිඩ මඟින්/ පොලිස් අණදෙන මැදිරි දුරකථන පණිවිඩ මඟින් දැනුම්දීම සහ පොලිස් වෙබ් අඩවියේ පළ කිරීම

**7.4. කුසලතා පදනම මත බඳවා ගැනීම:**

7.4.1. බඳවා ගන්නා තනතුර : උප පොලිස් පරික්ෂක/ කාන්තා උප පොලිස් පරීක්‍ෂක/ උප පොලිස් පරීක්‍ෂක (වි.කා.බ.)/ කාන්තා උප පොලිස් පරීක්‍ෂක (වි.කා.බ.)

7.4.2. සුදුසුකම් :

7.4.2.1. අධ්‍යාපන සුදුසුකම් : අදාළ නොවේ.

7.4.2.2. වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ.

7.4.2.3. සේවා පළපුරුද්ද : පොලිස් මහ සැරයන් තනතුරේ නිලධරයකු වීම හෝ පොලිස් සැරයන් තනතුරේ අවම වශයෙන් වසර 05 ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම .

7.4.2.4. කායික සුදුසුකම් : අදාළ නොවේ.

7.4.2.5. වෙනත් :

i. නිලධාරියාගේ කාර්ය සාධන ඇගයීම සතුටුදායක මට්ටමට වඩා ඉහළ මට්ටමක් අනුයාත වසර 05 ක් තුළ ලබා ඇති නිලධරයන් අයදුම් කිරීමට යෝග්‍යතාවය ලබයි.

ii. විශේෂ වැටුප් වර්ධක හැර වැටුප් වර්ධක 05 ක් උපයාගෙන තිබීම.

iii. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූලව දඬුවමක් ලබා නොතිබිය යුතුය.

iv. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගෙන තිබීම.

7.4.3. වයස

7.4.3.1 අවම සීමාව : අදාළ නොවේ

7.4.3.2. උපරිම සීමාව : අදාළ නොවේ

7.4.4. බඳවා ගැනීමේ ක්‍රමය:

7.4.4.1. ලිඛිත විභාගය : අදාළ නොවේ.

7.4.4.2. වෘත්තීය පරීක්‍ෂණය : අදාළ නොවේ.

7.4.4.3. සාමාන්‍ය සම්මුඛ පරීක්‍ෂණය : අදාළ නොවේ.

7.4.4.4. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්‍ෂණය:

| අනු අංකය | ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂය | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීම සඳහා සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | අමතර අධ්‍යාපන සුදුසුකම් | 10 | 40 |
| 02 | විශිෂ්ට දක්‍ෂතා | 35 | |
| 03 | ක්‍රීඩා | 10 | |
| 04 | පාඨමාලා | 15 | |
| 05 | වෘත්තීය ප්‍රවීණතා | 10 | |
| 06 | පදක්කම් | 10 | |
| 07 | සම්මුඛ පරීක්‍ෂණයේ දී දක්වන කුසලතාවය | 10 | |
| | මුළු ලකුණු | 100 | |

නිර්ණායක සහ ලකුණු ලබාදීමේ පටිපාටිය : ඇමුණුම **IX** හි වේ.

7.4.4.4.1. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා : ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් බලය පවරන ලද පොලිස්පති.

7.4.5. තෝරා ගැනීම:

සුදුසුකම් ලබන අයදුම්කරුවන් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයෙන් ලබා ගන්නා ලකුණු අවරෝහණ ක්‍රමයට සකස් කර පවතින පුරප්පාඩු සංඛ්‍යාව මත ප්‍රමුඛතා අනුපිළිවෙල අනුව සුදුස්සන් තෝරා ගනු ලැබේ. සුදුසුකම් ලබන අයදුම්කරුවන් ගණන පවතින පුරප්පාඩු ප්‍රමාණයට වඩා අඩු වුව ද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පැවැත්විය යුතුය.

7.4.6. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : ශ්‍රී ලංකා පොලිසිය තුළ දෛනික දුරකථන පණිවිඩ මගින්/ පොලිස් අණදෙන මැදිරි දුරකථන පණිවිඩ මගින් දැනුම්දීම සහ පොලිස් වෙබ් අඩවියේ පළ කිරීම

## 7.5. ජ්‍යෙෂ්ඨතාවය මත:

7.5.1. බඳවා ගන්නා තනතුර : උප පොලිස් පරීක්ෂක/ කාන්තා උප පොලිස් පරීක්ෂක/ උප පොලිස් පරීක්ෂක (වි.කා.බ.)/ කාන්තා උප පොලිස් පරීක්ෂක (වි.කා.බ.)

7.5.2. සුදුසුකම් :

7.5.2.1. අධ්‍යාපන සුදුසුකම් : අදාළ නොවේ.

7.5.2.2. වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ.

7.5.2.3. සේවා පළපුරුද්ද : මහ සැරයන් තනතුරේ වසර 03 ක හෝ පොලිස් සැරයන් තනතුරේ වසර 08 ක සක්‍රිය සේවා කාලයක් සහිත නිලධරයකු වීම.

7.5.2.4. කායික සුදුසුකම් : අදාළ නොවේ.

7.5.2.5. වෙනත් :

i. මහ සැරයන්වරයකු තුන්වන කාර්යක්ෂමතා කඩඉම සමත් වී තිබිය යුතුය.

ii. සැරයන්වරයකු දෙවන කාර්යක්ෂමතා කඩඉම සමත් වී තිබිය යුතුය.

iii. මහ සැරයන් තනතුරේ වැටුප් වර්ධක 03 ක් උපයාගෙන තිබීම හෝ පොලිස් සැරයන් තනතුරේ වැටුප් වර්ධක 08 ක් උපයාගෙන තිබීම. (විශේෂ වැටුප් වර්ධක හැර)

iv. කාර්ය සාධන ඇගයීම් අනුව වසර 08 ක සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

v. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූලව දඬුවමක් ලබා නොතිබිය යුතුය.

vi. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගෙන තිබීම.

7.5.3. වයස:

7.5.3.1. අවම සීමාව : අදාළ නොවේ

7.5.3.2. උපරිම සීමාව : අදාළ නොවේ

7.5.4. බඳවා ගැනීමේ ක්‍රමය:

| | |
|---|---|
| 7.5.4.1. ලිඛිත විභාගය | : අදාළ නොවේ. |
| 7.5.4.2. වෘත්තීය පරීක්ෂණය | : අදාළ නොවේ. |
| 7.5.4.3. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය | : අදාළ නොවේ |
| 7.5.4.4. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය | : අදාළ නොවේ. |

7.5.5. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : අදාළ නොවේ.

7.5.6. තෝරා ගැනීම:

ඉහත 7.5.2 හි සුදුසුකම් සපුරා ඇති නිලධරයන් ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙලට අනුව පුරප්පාඩු සංඛ්‍යාව මත පත්කිරීමේ බලධරයා විසින් උසස් කරනු ලබන අතර, ආයතන සංග්‍රහයේ දෙවන කාණ්ඩයේ XLVIII වන පරිච්ඡේදයේ 14:12 වගන්තිය අනුව එවැනි නිලධරයකු විනය නියෝගයට යටත්ව ක්‍රියාකිරීම සඳහා පොරොත්තු ලේඛන ගත කරනු ලැබේ.

7.6. පුහුණුව :

7.6.1. විවෘතව බඳවා ගනු ලබන නිලධරයන් පොලිස්පති විසින් නියම කරන ලද දිනයක දී මූලික පුහුණුව සඳහා කැඳවනු ලැබේ.

7.6.2. මූලික පුහුණුව ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ දී ලබාදීම සිදු කරනු ලැබේ.

7.6.3. මූලික පුහුණුව සාර්ථකව අවසන් නොකරන නිලධරයන්ගේ මූලික පුහුණු කාලය දීර්ඝ කිරීම හෝ අවස්ථානුකූලව පත්වීම අවලංගු කිරීම පත්කිරීමේ බලධරයා විසින් තීරණය කරනු ලැබේ. එම තීරණය ප්‍රකාරව මූලික පුහුණුව දීර්ඝ කිරීමක් කළහොත් එම කාලයට සමාන කාලසීමාවකින් පරිවාස කාලය ද දීර්ඝ කරනු ලැබේ.

7.6.4. සීමිත පදනම මත, ජ්‍යෙෂ්ඨතාවය මත සහ කුසලතාව මත බඳවා ගනු ලබන නිලධරයන් තනතුරට හැඩගැස්වීම සඳහා වූ පුහුණු පාඨමාලාවක් 8.1 ඡේදයෙ හි සඳහන් පරිදි සිදු කළ යුතුය.

7.7. සේවා කොන්දේසි :

7.7.1. විවෘත පදනමින් තෝරා ගනු ලබන අයදුම්කරුවන් පහත 7.7.3. වගන්තියට යටත්ව තුන් (03) අවුරුදු පරිවාස කාල පරිච්ඡේදයක් සම්පූර්ණ කළ යුතු අතර, සීමිත පදනම, ජ්‍යෙෂ්ඨතාවය, සහ කුසලතාව මත බඳවා ගනු ලබන අයදුම්කරුවන් සඳහා එක් (01) අවුරුදු පරිවාස කාල පරිච්ඡේදයක් සම්පූර්ණ කළ යුතුය.

7.7.2 තෝරා ගනු ලබන අයදුම්කරුවන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් සම්පාදිතව පවත්නා සහ මින් මතු ඒ සම්බන්ධයෙන් සම්පාදනය කරනු ලබන කිසියම් නියෝග වෙතොත් ඒවාටද අනුකූලව කටයුතු කළ යුතුය.

7.7.3 පොලිස් ආඥා පනතේ විධිවිධාන ඇතුළුව ජාතික පොලිස් කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, කොන්දේසි සහ චක්‍රලේඛ, ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, භාණ්ඩාගාර චක්‍රලේඛ, ශ්‍රී ලංකා පොලිස් නියෝග, පොලිස් ගැසට් නිවේදන, පොලිස්පති චක්‍රලේඛ, වෙනත් උපදෙස් සංග්‍රහවල විධිවිධාන සහ පත්වීම් ලිපියේ ඇතුළත් කොන්දේසි වලට ද යටත් විය යුතුයි.

7.7.4 තුන් (03) අවුරුදු පරිවාස කාලය තුල සිටින නිලධරයකු සම්බන්ධයෙන් වන සුවිශේෂි වූ කරුණු පිළිබඳව සලකා බලා පොලිස්පති හෝ පොලිස්පති විසින් නම් කරන ලද නිලධරයකුගේ විශේෂ අවසරයක් ඇතුව මිස එම කාලය තුළදී විවාහ විය නොහැක. මෙම රෙගුලාසිය උල්ලංඝනය කළහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

7.7.5 බඳවා ගන්නා අයදුම්කරුවන් බඳවා ගන්නා අවස්ථාවේ දී අවුරුදු 05 ක අනිවාර්ය සේවා කාලයක් සඳහා ගිවිසුමකට ඇතුළත් විය යුතුය. මෙම ගිවිසුමේ කොන්දේසි උල්ලංඝනය කරන අවස්ථාවන්හි දී පවත්නා නීති/ ආයතන සංග්‍රහය/ කාර්ය පටිපාටික රීති සහ ජාතික පොලිස් කොමිෂන් සභාවේ විධිවිධානයන්ට යටත්ව කටයුතු කරනු ලැබේ.

7.7.6 බඳවා ගැනීමේ දී අයදුම්කරුවන් විසින් අසත්‍ය තොරතුරු සැපයීම ඔහු/ ඇය බඳවා ගැනීමට නුසුදුසුකමක් වේ. අසත්‍ය තොරතුරු සැපයූ බවට බඳවා ගැනීමෙන් පසුව හෙළිවන ඕනෑම අවස්ථාවක දී සේවයෙන් ඉවත් කරනු ලැබේ.

7.8. පත්වීම ස්ථිර කිරීම :

7.8.1. විවෘත පදනමින් බඳවා ගනු ලබන නිලධරයන් සඳහා පරිවාස කාලය තුළ දී ආධුනික ගොනුවක් පවත්වාගෙන යා යුතුය. පරිවාස කාලය අවසානයේ දී එම නිලධරයන්ගේ සේවය ස්ථිර කිරීම, පත්කිරීමේ බලධරයා හෝ ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් බලය අභිනියෝජිත බලධරයා විසින් සිදු කරනු ලැබේ.

7.8.2. සීමිත පදනම මත, ජ්‍යෙෂ්ඨතා පදනම මත සහ කුසලතාව මත බඳවා ගත් නිලධරයන් වසරක (01) පරිවාස කාලය තුළ දී මාසිකව පවත්වනු ලබන ප්‍රගති ගොනුවක් මාස 12 ක් පවත්වාගෙන යා යුතුය. සම්පූර්ණ කරන ලද ප්‍රගති ගොනුව පරීක්ෂා කිරීමෙන් අනතුරුව එම නිලධරයන්ගේ සේවය ස්ථිර කිරීම, පත්කිරීමේ බලධරයා හෝ ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් බලය අභිනියෝජිත බලධරයා විසින් සිදු කරනු ලැබේ.

7.8.3 පරිවාස කාලයකට යටත් කොට ඇති නිලධරයකුගේ පත්වීම ස්ථිර කිරීම, පරිවාස කාලය දීර්ඝ කිරීම හෝ පත්වීම අවසන් කිරීම පවත්නා කාර්ය පටිපාටික රීතිහි විධිවිධානයන්ට අනුකූලව පත්කිරීමේ බලධරයා හෝ ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් බලය අභිනියෝජිත බලධරයා විසින් සිදු කරනු ලැබේ.

**8. කාර්යක්ෂමතා කඩඉම්:**

8.1.

| කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙර ද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය : ලිඛිත පරීක්ෂණය/ වෘත්තීය පරීක්ෂණය/ සහතික පාඨමාලාව/ වෙනත් |
|---|---|---|
| පළමු වන කාර්යක්ෂමතා කඩඉම | තුන් (03) අවුරුදු පරිවාස කාලයට යටත් උප පොලිස් පරීක්ෂක/ කාන්තා උප පොලිස් පරීක්ෂක මුල් පත්වීමේ දිනයේ සිට වසර තුනක් (03) ඇතුළත | ලිඛිත, ප්‍රායෝගික හා වාචික |
| | එක් (01) අවුරුදු පරිවාස කාලයට යටත් උප පොලිස් පරීක්ෂක / කාන්තා උප පොලිස් පරීක්ෂක මුල් පත්වීමේ දිනයේ සිට වසර තුනක් (03) ඇතුළත | තනතුරට හැඩ ගැස්වීමේ පුහුණු පාඨමාලාව සාර්ථකව හදාරා ඇති බවට සහතික පත්‍රය ලබා තිබීම |
| දෙවන කාර්යක්ෂමතා කඩඉම | පොලිස් පරීක්ෂක/ කාන්තා පොලිස් පරීක්ෂක තනතුරට පත්වී වසර 03 ක් ගත වීමට පෙර | තනතුරට හැඩගැස්වීමේ පුහුණු පාඨමාලාව සාර්ථකව හදාරා ඇති බවට සහතික පත්‍රය ලබා තිබීම |
| තුන්වන කාර්යක්ෂමතා කඩඉම | ප්‍රධාන පොලිස් පරීක්ෂක/ කාන්තා ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුරට පත් වී වසර 03 ක් ගත වීමට පෙර | තනතුරට හැඩගැස්වීමේ පුහුණු පාඨමාලාව සාර්ථකව හදාරා ඇති බවට සහතික පත්‍රය ලබා තිබීම |

විභාග නිර්ණායක සහ විෂය නිර්දේශය ඇමුණුම **X** හි වේ.

8.2. කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක් ද? :

| | |
|---|---|
| පළමුවන කාර්යක්ෂමතා කඩඉම | වසරකට දෙවරක්<br>(තුන් අවුරුදු පරිවාස කාලයට යටත් නිලධරයන් සඳහා) |
| | උප පොලිස් පරීක්ෂක තනතුරට උසස්කිරීම් සිදුකරන සෑම අවස්ථාවකට වරක් හෝ අවම වශයෙන් වසරකට එක් වරක් (එක් අවුරුදු පරිවාස කාලයට යටත් නිලධරයන් සඳහා) |
| දෙවන කාර්යක්ෂමතා කඩඉම | පොලිස් පරීක්ෂක තනතුරට නිලධරයන් උසස්කිරීම් සිදුකරන සෑම අවස්ථාවකට වරක් හෝ අවම වශයෙන් වසරකට එක් වරක් |
| තුන්වන කාර්යක්ෂමතා කඩඉම | ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුරට නිලධරයන් උසස්කිරීම් සිදුකරන සෑම අවස්ථාවකට වරක් හෝ අවම වශයෙන් වසරකට එක් වරක් |

8.3. කාර්යක්ෂමතා කඩඉම්වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන් ද?:

| කාර්යක්ෂමතා කඩඉම | පවත්වන බලධරයා |
|---|---|
| පළමුවන කාර්යක්ෂමතා කඩඉම | පොලිස්පති විසින් බලය පවරන ලද බලධරයා |
| දෙවන කාර්යක්ෂමතා කඩඉම | පොලිස්පති විසින් බලය පවරන ලද බලධරයා |
| තුන්වන කාර්යක්ෂමතා කඩඉම | පොලිස්පති විසින් බලය පවරන ලද බලධරයා |

## 09. භාෂා ප්‍රවීණතාවය :

9.1.

| භාෂාව | ලබා ගත යුතු ප්‍රවීණතාවය |
|---|---|
| 01. රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පත්වීම් දින සිට වසර 03ක් ඉකුත් වීමට පෙර ලබාගත යුතුය. |
| 02. අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට අනුෂංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය. |

## 10. උසස් කිරීම :

### 10.1. උප පොලිස් පරීක්ෂක තනතුරේ සිට පොලිස් පරීක්ෂක තනතුරට උසස් කිරීම.

10.1.1. උසස්වීම් ක්‍රමවේදය :

i. ජ්‍යෙෂ්ඨතාවය
ii. සීමිත තරඟ විභාග
iii. කුසලතාව

10.1.2. උසස්වීම් අනුපාතය

| උසස්වීම් ක්‍රමවේදය | උසස්වීම් අනුපාතය |
|---|---|
| ජ්‍යෙෂ්ඨතාවය | 50% |
| සීමිත තරඟ විභාග | 25% |
| කුසලතාව | 25% |

**10.1.3** ජ්‍යෙෂ්ඨතාවය මත

10.1.3.1. සපුරාලිය යුතු සුදුසුකම් :

i. උප පොලිස් පරීක්ෂක තනතුරේ පත්වීම ස්ථිර කර තිබීම.

ii. උප පොලිස් පරීක්ෂක තනතුරේ වසර 08ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

iii. විශේෂ වැටුප් වර්ධක හැර වැටුප් වර්ධක 08ක් උපයාගෙන තිබීම.

iv. අනුමත කාර්ය සාධන ඇගයීම් පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර 08ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

v. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූලව දඬුවමක් ලබා නොතිබිය යුතුය.

vi. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගෙන තිබීම.

10.1.3.2. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ

10.1.3.2.1. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පවත්වන බලධරයා : අදාළ නොවේ

10.1.3.3. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : අදාළ නොවේ

10.1.3.4. උසස් කිරීමේ ක්‍රමය :

ඉහත 10.1.3.1 සුදුසුකම් සපුරා ඇති නිලධරයන් ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙලට අනුව පුරප්පාඩු සංඛ්‍යාව මත පත්කිරීමේ බලධරයා විසින් උසස් කරනු ලබන අතර, ආයතන සංග්‍රහයේ දෙවන කාණ්ඩයේ XLVIII වන පරිච්ඡේදයේ 14:12 වගන්තිය අනුව එවැනි නිලධරයකු විනය නියෝගයට යටත්ව ක්‍රියාකිරීම සඳහා පොරොත්තු ලේඛන ගත කරනු ලැබේ.

**10.1.4.** සීමිත තරඟ විභාගය

10.1.4.1. සපුරාලිය යුතු සුදුසුකම් :

i. උප පොලිස් පරීක්ෂක තනතුරේ පත්වීම ස්ථිර කර තිබීම.

ii. උප පොලිස් පරීක්ෂක තනතුරේ අවම වශයෙන් වසර 05ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

iii. විශේෂ වැටුප් වර්ධක හැර වැටුප් වර්ධක 05ක් උපයාගෙන තිබීම.

iv. අනුමත කාර්ය සාධන ඇගයීම් පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර 05ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

v. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූලව දඬුවමක් ලබා නොතිබිය යුතුය.

vi. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගෙන තිබීම.

10.1.4.2. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : ශ්‍රී ලංකා පොලීසිය තුළ දෛනික දුරකථන පණිවිඩ මගින්/ පොලිස් අණදෙන මැදිරි දුරකථන පණිවිඩ මගින් දැනුම්දීම සහ පොලිස් වෙබ් අඩවියේ පළ කිරීම

10.1.4.3. ලිඛිත විභාගය :

| විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. නීතිය | 100 | 40 |
| 2. පොලිස් නියෝග හා ප්‍රායෝගික පොලිස් විධි | 100 | 40 |
| 3. සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය | 100 | 40 |

විභාග නිර්ණායක සහ විෂය නිර්දේශය: ඇමුණුම **XI** හි වේ.

සටහන: මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අතුරින් එක් එක් විෂය සමත් වීම සඳහා අවම ලකුණු ප්‍රමාණය සපුරා ඇති අයදුම්කරුවන් ලබා ගත් මුලු ලකුණු ප්‍රමාණය අවරෝහණ ක්‍රමයට සකස් කර පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව අනුව පිළිවලින් වැඩිම ලකුණු ලබාගත් අයදුම්කරුවන් තෝරා ගනු ලැබේ.

10.1.4.3.1. විභාගය පවත්වන බලධරයා :- පොලිස්පති විසින් බලය පවරන ලද නිලධරයා

10.1.4.4. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ

10.1.4.4.1. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා : අදාළ නොවේ

10.1.4.5. උසස් කිරීමේ ක්‍රමය:

මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අතුරින් එක් එක් විෂය සමත් වීම සඳහා අවම ලකුණු ප්‍රමාණය සපුරා ඇති අයදුම්කරුවන් ලබා ගත් මුළු ලකුණු ප්‍රමාණය අවරෝහණ ක්‍රමයට සකස් කර පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව අනුව පිළිවලින් වැඩිම ලකුණු ලබාගත් අයදුම්කරුවන් පත්කිරීමේ බලධරයා විසින් උසස් කරනු ලබන අතර, ආයතන සංග්‍රහයේ දෙවන කාණ්ඩයේ XLVIII වන පරිච්ඡේදයේ 14:12 වගන්තිය අනුව එවැනි නිලධරයකු විනය නියෝගයට යටත්ව ක්‍රියාකිරීම සඳහා පොරොත්තු ලේඛන ගත කරනු ලැබේ.

**10.1.5.**කුසලතාව මත

10.1.5.1. සපුරාලිය යුතු සුදුසුකම් :

i. උප පොලිස් පරීක්ෂක තනතුරේ පත්වීම ස්ථිර කර තිබීම.

ii. උප පොලිස් පරීක්ෂක තනතුරේ වසර 05 ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

iii. විශේෂ වැටුප් වර්ධක හැර වැටුප් වර්ධක 05 ක් උපයාගෙන තිබීම.

iv. අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ අනුයාත වසර 05 ක් තුළ සාමාන්‍ය මට්ටමට වඩා ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

v. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූලව දඬුවමක් ලබා නොතිබිය යුතුය.

vi. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගෙන තිබීම.

10.1.5.2. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය :

| අනු අංකය | ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂය | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | අමතර අධ්‍යාපන සුදුසුකම් | 10 | අදාළ නොවේ |
| 02 | විශිෂ්ට දක්ෂතා | 25 | |
| 03 | ක්‍රීඩා | 10 | |
| 04 | පාඨමාලා | 15 | |
| 05 | වෘත්තීය ප්‍රවීණතා | 20 | |
| 06 | පදක්කම් | 10 | |
| 07 | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය | 10 | |
| | **මුළු ලකුණු** | **100** | |

නිර්ණායක සහ ලකුණු ලබා දීමේ පටිපාටිය: ඇමුණුම **XII** හි වේ.

10.1.5.2.1. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා : ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් බලය පවරන ලද පොලිස්පති.

10.1.5.3. උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් ලබන අයදුම්කරුවන් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයෙන් ලබාගන්නා ලකුණු අවරෝහණ ක්‍රමයට සකස් කර පවතින පුරප්පාඩු සංඛ්‍යාව මත ලකුණු ප්‍රමුඛතා අනුපිළිවෙල අනුව සුදුස්සන් තෝරා ගනු ලැබේ. සුදුසුකම් ලබන අයදුම්කරුවන් ගණන පවතින පුරප්පාඩු ප්‍රමාණයට වඩා අඩු වුව ද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පැවැත්විය යුතුය.

10.1.5.4. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය: ශ්‍රී ලංකා පොලිසිය තුළ දෛනික දුරකථන පණිවිඩ මගින්/ පොලිස් අණදෙන මැදිරි දුරකථන පණිවිඩ මගින් දැනුම්දීම සහ පොලිස් වෙබ් අඩවියේ පළ කිරීම

**10.2.** පොලිස් පරීක්ෂක තනතුරේ සිට ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුරට උසස් කිරීම.

10.2.1. උසස්වීම් ක්‍රමවේදය.

i. ජ්‍යෙෂ්ඨතාවය
ii. සීමිත තරඟ විභාග
iii. කුසලතාව මත

10.2.2. උසස්වීම් අනුපාතය

| උසස්වීම් ක්‍රමවේදය | උසස්වීම් අනුපාතය |
|---|---|
| ජ්‍යෙෂ්ඨතාවය | 50% |
| සීමිත තරඟ විභාග | 25% |
| කුසලතාව මත | 25% |

**10.2.3.** ජ්‍යෙෂ්ඨතාවය මත

10.2.3.1. සපුරාලිය යුතු සුදුසුකම් :

i. පොලිස් පරීක්ෂක තනතුරට පත්වීමෙන් පසු දෙවන කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කර තිබීම.

ii. පොලිස් පරීක්ෂක තනතුරේ වසර 06 ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

iii. විශේෂ වැටුප් වර්ධක හැර වැටුප් වර්ධක 06ක් උපයාගෙන තිබීම.

iv. අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර 06 ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

v. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූලව දඬුවමක් ලබා නොතිබිය යුතුය.

vi. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගෙන තිබීම.

10.2.3.2. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ

10.2.3.2.1. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පවත්වන බලධරයා : අදාළ නොවේ

10.2.3.3. උසස් කිරීමේ ක්‍රමය:

ඉහත 10.2.3.1 හි සුදුසුකම් සපුරා ඇති නිලධරයන් ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙලට අනුව පුරප්පාඩු සංඛ්‍යාව මත පත්කිරීමේ බලධරයා විසින් උසස් කරනු ලබන අතර, ආයතන සංග්‍රහයේ දෙවන කාණ්ඩයේ XLVIII වන පරිච්ඡේදයේ 14:12 වගන්තිය අනුව එවැනි නිලධරයකු විනය නියෝගයට යටත්ව ක්‍රියාකිරීම සඳහා පොරොත්තු ලේඛන ගත කරනු ලැබේ.

10.2.3.4. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : අදාළ නොවේ

**10.2.4.** සීමිත තරඟ විභාගය

10.2.4.1. සපුරාලිය යුතු සුදුසුකම් :

i. පොලිස් පරීක්ෂක තනතුරට පත්වීමෙන් පසු දෙවන කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කර තිබීම.

ii. පොලිස් පරීක්ෂක තනතුරේ වසර 04ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

iii. විශේෂ වැටුප් වර්ධක හැර වැටුප් වර්ධක 04ක් උපයාගෙන තිබීම.

iv. අනුමත කාර්ය සාධන ඇගයීම් පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර 04ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

v. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූලව දඬුවමක් ලබා නොතිබිය යුතුය.

vi. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගෙන තිබීම.

10.2.4.2. ලිඛිත විභාගය :

| විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| නීතිය | 100 | 40 |
| පොලිස් නියෝග හා ප්‍රායෝගික පොලිස් විධි | 100 | 40 |
| සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය | 100 | 40 |

විභාග නිර්ණායක සහ විෂය නිර්දේශය : ඇමුණුම **XIII** හි වේ.

10.2.4.2.1. විභාගය පවත්වන බලධරයා :- පොලිස්පති විසින් බලය පවරන ලද නිලධරයා

10.2.4.3. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ

10.2.4.3.1. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා:අදාළ නොවේ

10.2.4.4. උසස් කිරීමේ ක්‍රමය:

මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අතුරින් එක් එක් විෂය සමත් වීම සඳහා අවම ලකුණු ප්‍රමාණය සපුරා ඇති අයදුම්කරුවන් ලබා ගත් මුළු ලකුණු ප්‍රමාණය අවරෝහණ ක්‍රමයට සකස් කර පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව අනුව පිළිවලින් වැඩිම ලකුණු ලබාගත් අයදුම්කරුවන් පත්කිරීමේ බලධරයා විසින් උසස් කරනු ලබන අතර, ආයතන සංග්‍රහයේ දෙවන කාණ්ඩයේ XLVIII වන පරිච්ඡේදයේ 14:12 වගන්තිය අනුව එවැනි නිලධරයකු විනය නියෝගයට යටත්ව ක්‍රියාකිරීම සඳහා පොරොත්තු ලේඛන ගත කරනු ලැබේ.

10.2.4.5. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : ශ්‍රී ලංකා පොලිසිය තුළ දෛනික දුරකථන පණිවිඩ මගින්/ පොලිස් අණදෙන මැදිරි දුරකථන පණිවිඩ මගින් දැනුම්දීම සහ පොලිස් වෙබ් අඩවියේ පළ කිරීම

**10.2.5. කුසලතාව මත**

10.2.5.1. සපුරාලිය යුතු සුදුසුකම් :

i. පොලිස් පරීක්ෂක තනතුරට පත්වීමෙන් පසු දෙවන කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කර තිබීම.

ii. පොලිස් පරීක්ෂක තනතුරේ වසර 04 ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

iii. විශේෂ වැටුප් වර්ධක හැර වැටුප් වර්ධක 04 ක් උපයාගෙන තිබීම.

iv. අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ අනුයාත වසර 04 ක් තුළ සාමාන්‍ය මට්ටමට වඩා ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

v. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූලව දඬුවමක් ලබා නොතිබිය යුතුය.

vi. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගෙන තිබීම.

10.2.5.2. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය:

| අනු අංකය | ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂය | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 01 | අමතර අධ්‍යාපන සුදුසුකම් | 15 |
| 02 | විශිෂ්ඨ දක්ෂතා | 20 |
| 03 | ක්‍රීඩා | 10 |
| 04 | පාඨමාලා | 15 |
| 05 | වෘත්තීය ප්‍රවීණතා | 20 |
| 06 | පදක්කම් | 10 |
| 07 | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය | 10 |
| | මුළු ලකුණු | **100** |

නිර්ණායක හා ලකුණු ලබා දීමේ පටිපාටිය: ඇමුණුම **XIV** හි වේ.

10.2.5.2.1. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා : ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් බලය පවරන ලද පොලිස්පති.

10.2.5.3. උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් ලබන අයදුම්කරුවන් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයෙන් ලබා ගන්නා ලකුණු අවරෝහණ ක්‍රමයට සකස් කර පවතින පුරප්පාඩු සංඛ්‍යාව මත ප්‍රමුඛතා අනුපිළිවෙල අනුව සුදුස්සන් තෝරා ගනු ලැබේ. සුදුසුකම් ලබන අයදුම්කරුවන් ගණන පවතින පුරප්පාඩු ප්‍රමාණයට වඩා අඩු වුව ද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පැවැත්විය යුතුය.

10.2.5.4. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : ශ්‍රී ලංකා පොලිසිය තුළ දෛනික දුරකථන පණිවිඩ මගින්/ පොලිස් අණදෙන මැදිරි දුරකථන පණිවිඩ මගින් දැනුම්දීම සහ පොලිස් වෙබ් අඩවියේ පළ කිරීම

සංලක්ෂය :-

**01.** මෙම බඳවා ගැනීමේ පරිපාටියේ දක්වා ඇති උසස් වීමේ ක්‍රමවේදයන් ක්‍රියාත්මක කළ යුතු සහ ජ්‍යෙෂ්ඨතාවය පිහිටවිය යුතු අනුපිළිවෙල පහත පරිදි විය යුතුය.

i. ජ්‍යෙෂ්ඨතා පදනම මත

ii. කුසලතා පදනම මත

iii. සීමිත තරඟ විභාගය මත

එසේ වුවද, වෙන් වෙන් දිනවලදී උසස්වීම් ක්‍රියාත්මක කරන විට උසස් වීම ක්‍රියාත්මක කරන දිනය අනුව සාමාන්‍ය පරිදි ජ්‍යෙෂ්ඨතාවය පිහිටවිය යුතුය.

11. තනතුරුවලට පත්කිරීම : අදාළ නොවේ

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ කොන්දේසි.

සියලුම අයදුම්කරුවන් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි, ආයතන සංග්‍රහයේ පළමුවන හා දෙවන වෙළුමේ විධිවිධාන හා ඊට පරිබාහිර වන්නා වූ චක්‍රලේඛ හා කොන්දේසි, ශ්‍රී ලංකා පොලිස් නියෝග, පොලිස්පති චක්‍රලේඛ, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ සහ මුදල් රෙගුලාසි, විධිවිධානවලට යටත් වේ.

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ:

**"ඉඳුරාම බඳවා ගැනීම"** යනුවෙන් අදහස් කරන්නේ උප පොලිස් පරීක්ෂක තනතුර සඳහා විවෘත තරඟ විභාගයක ප්‍රතිඵල මත බඳවා ගැනීම වේ.

**"පසුබිම් වාර්තාව"**

යම් අයදුම්කරුවකු ශ්‍රී ලංකා පොලිසියට බඳවා ගැනීම සඳහා එම අයදුම්කරුගේ, ඔහුගේ දෙමාපියන් හා සමීප ඥාතින් ගේ සහ සමීපව ඇසුරු කරනු ලබන අයවළුන්ගේ අපරාධ වාර්තා, රාජ්‍ය විරෝධී ක්‍රියා හෝ වෙනත් නීති විරෝධී ක්‍රියා සම්බන්ධව සහ චරිතය සම්බන්ධව පරීක්ෂා කර අයදුම්කරු ශ්‍රී ලංකා පොලිසියට බඳවා ගැනීමට අයහපත් ලෙස බලපෑම් ඇති කරන්නේ ද යන්න සම්බන්ධව බුද්ධි අංශ හා පොලිස් ස්ථාන මඟින් ලබා ගන්නා තොරතුරු මත පදනම්ව සකසනු ලබන වාර්තාවකි.

**"රා.සේ.කො. සභා චක්‍රලේඛ අංක 01/2020 අනුව විනය දඬුවම් සඳහා සේවා කාලය බැහැර කිරීම පැහැදිලි කිරීම"**

අසාධු සටහනක් වලංගු වන දින සිට මාස 02 ක් ද, විනය ශාලාව මඟින් ලබාදෙන ආයතන සංග්‍රහයේ සඳහන් වන දඬුවමක් එය ක්‍රියාත්මක වන දින සිට මාස 06 ක කාලයක් ද, බඳවා ගැනීමේ පටිපාටියට අනුව ලබාදෙන උසස්වීමකට සතුටුදායක සේවා කාලය සලකා බැලීමේදී සලකා බලනු නොලැබේ.

අනෙකුත් විනය දඬුවම් අනුව සතුටුදායක සේවා කාලය ගණනය කිරීම රා.සේ.කො.ස.චක්‍රලේඛ 01/2020 අනුව සිදු විය යුතුය.

**14.** තනතුරුවලට අන්තර්ග්‍රහණය :

i. මෙම පටිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාළ වේ. නියමිත දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ මගින් ලබා දී ඇති RS 3-2025, RS 4-2025 හා RS 5-2025 වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන (උප පොලිස් පරීක්ෂක, පොලිස් පරීක්ෂක හා ප්‍රධාන පොලිස් පරීක්ෂක) ශ්‍රී ලංකා පොලිසියේ සේවයේ නියුතු පොලිස් හා නියාමන සේවා ගණයේ නිලධරයන් ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ 4 වන වගන්තියේ විධිවිධාන වලට යටත්ව මෙම බඳවා ගැනීමේ පරිපාටියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

ii. සේවා කාලය ගණන් ගනු ලබන්නේ ඒ ඒ තනතුරට පත් කරන ලද දිනය පදනම කරගෙනය. කෙසේ වතුදු, අන්තර්ග්‍රහණය හේතුවෙන් නිලධරයාගේ වැටුපෙහි හෝ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර, එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේදී අදාළ නිලධරයා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූප වීම මත ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊළඟ ඉහළ වැටුප් පියවරේ තැබීමද නොකළ යුතුය.

**15.** **සෑම පත්වීමක් සම්බන්ධයෙන් ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 2310/29 හා 2022.12.14 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.**

**16.** **මෙම බඳවා ගැනීමේ පටිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.**

**17.** අන්තර්කාලීන විධිවිධාන :

i. මෙම බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කරන ලද දිනය වන විට මෙම බඳවා ගැනීමේ පටිපාටිය අනුව, දෙවන හා තුන්වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කළ යුතු දිනය වසරක් ඇතුළත එළඹීමට නියමිත යම් නිලධරයකු සඳහා එම කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කිරීම සඳහා අමතර වසර දෙකක කාලයක් ලබා දෙනු ලබන අතර, එම අමතර කාලය ඇතුළත එවැනි නිලධරයකු යම් උසස් කිරීමක් සඳහා අයදුම් කිරීමේ දී එම කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ වූ නිලධරයකු ලෙස සලකනු ලැබේ.

ii. මෙම බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කරන ලද දිනය වන විට මෙම බඳවා ගැනීමේ පටිපාටිය අනුව, දෙවන හා තුන්වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කළ යුතු දිනය වසර දෙකක් ඇතුළත එළඹීමට නියමිත යම් නිලධරයකු සඳහා එම කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කිරීම සඳහා අමතර වසරක කාලයක් ලබාදෙනු ලබන අතර, එම අමතර කාලය ඇතුළත එවැනි නිලධරයකු යම් උසස් කිරීමක් සඳහා අයදුම් කිරීමේ දී එම කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ වූ නිලධරයෙකු ලෙස සලකනු ලැබේ.

iii. මෙම බඳවා ගැනීමේ පටිපාටිය සංශෝධනය කරන ලද දිනය කුමක් වුවද, එම සංශෝධනවල ඇතුළත් විධිවිධාන ඡේද අංක 14 යටතේ අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධරයන්ට එම අන්තර්ග්‍රහණය කල දින සිට අදාළ විය යුතුය.

iv. මෙම බඳවා ගැනීමේ පටිපාටිය අනුමත වීමෙන් පසු පැවැත්වෙන උසස් කිරීම්වලදී, සපුරාලිය යුතු සුදුසුකමක් වශයෙන් සලකනු ලබන කාර්ය සාධන ඇගයීම් ප්‍රමාණය තීරණය කළ යුත්තේ මෙම බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කරන ලද දිනයේ සිට සුදුසුකම් සම්පූර්ණ කරන දින දක්වා ගත වී ඇති වසර ගණන හෝ සුදුසුකම්වල සඳහන් කාර්ය සාධන ඇගයීම් ගණනය කරන වසර ගණන යන දෙකෙන් අඩු වසර ගණන වේ.

සකස් කලේ: අත්සන ..........................
(විෂය භාර කනිෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම : එච්. අනුෂා දර්ශනි මල්කාන්ති
තනතුර : පරිපාලන නිලධාරි (ආයතනික ප්‍රතිපත්ති, බඳවා ගැනීම් හා උසස් කිරීම් පරිපාටි)

දිනය : 2016.02.03

එච්. අනුෂා දර්ශනී මල්කාන්ති
පරිපාලන නිලධාරි
ආයතනික ප්‍රතිපත්ති,
බඳවා ගැනීම් හා උසස් කිරීම් පරිපාටි
පොලිස් මූලස්ථානය
කොළඹ 01

පරීක්ෂා කලේ: අත්සන ..........................
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම : වජිර ගුණවර්ධන
තනතුර : අධ්‍යක්ෂ (සිවිල් පරිපාලන)

දිනය : 2016.02.03

වජිර ගුණවර්ධන
අධ්‍යක්ෂ (සිවිල් පරිපාලන)
ශ්‍රී ලංකා පරිපාලන සේවය I
ශ්‍රී ලංකා පොලීසිය
පොලිස් මූලස්ථානය
කොළඹ 02.

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන ..........................
ප්‍රියන්ත වීරසූරිය
පොලිස්පති

දිනය : 2016.02.04

නිල මුද්‍රාව :

ප්‍රියන්ත වීරසූරිය
පොලිස්පති
පොලිස් මූලස්ථානය
කොළඹ 02

**18.** අමාත්‍යාංශ නිර්දේශය

යොමු අංකය : 02/24/05/02/2025

ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් ........2026.01.22........ දින අනුමත කරන ලද ........ශ්‍රී ලංකා පොලිස් සේව........ අමාත්‍යාංශයෙහි/ දෙපාර්තමේන්තුවෙහි ........පොලිස් හා සමාන ... (ප්‍ර පොලිස් පරීක්ෂක)........ සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය සහතික කිරීම සඳහා නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ........

නම : ........

ලේකම්
මහජන ආරක්ෂක සහ
පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය.

දිනය : 2026-02-05

නිල මුද්‍රාව : ඩී.ඩබ්.ආර්.බී. සෙනෙවිරත්න
ලේකම්
මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය
18 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල

**19.** ජාතික පොලිස් කොමිෂන් සභාවේ අනුමැතිය

යොමු අංකය : NPC/ED/01/04/NGO(SI)/SOR

........ශ්‍රී ලංකා පොලිසියේ........ ~~අමාත්‍යාංශයෙහි/ දෙපාර්තමේන්තුවෙහි~~ ........පොලිස් හා නිලමන........ සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් ....2026.01.22.... දින අනුමත කරන ලදී.

අත්සන : ........

ලේකම්

ජාතික පොලිස් කොමිෂන් සභාව.

දිනය : 26/02/06

නිල මුද්‍රාව : තනුජා එන් ප්‍රනාන්දු
ලේකම්
ජාතික පොලිස් කොමිෂන් සභාව
ගොඩනැගිලි අංක 09, BMICH පරිශ්‍රය
කොළඹ 07

<u>අනුමත තනතුරු නාම වලට අදාළව පැවරෙන කාර්යයන්</u>

| තනතුර | කාර්යයන් |
|---|---|
| උප පොලිස් පරීක්ෂක<br><br>කාන්තා උප පොලිස් පරීක්ෂක | ➢ ශ්‍රී ලංකා ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානයන්ට අනුව කටයුතු කිරීම මූලික අයිතීන් ආරක්ෂා කිරීම සහ නීතියේ ආධිපත්‍ය සුරක්ෂිත කිරීම.<br><br>➢ ජාතික ආරක්ෂාව, නීතිය හා මහජන සාමය සුරක්ෂිත කිරීමට අදාළ කාර්යයන් ඉටු කිරීම.<br><br>➢ පොලිස් ආඥා පනතේ 56 වගන්තිය ප්‍රකාර පොලිස් නිලධාරින් සතු වගකීම් හා යුතුකම් ඉටු කිරීම.<br><br>➢ විවිධ අණපනත් යටතේ පවරා ඇති බලතල ප්‍රකාරව කටයුතු කිරීම.<br><br>➢ සේවයේ අවශ්‍යතාවය මත පොලිස්පති හෝ බලය පවරන ලද නිලධාරින් විසින් වරින් වර පවරනු ලබන රාජකාරි ඉටු කිරීම.<br><br>➢ ශ්‍රී ලංකා පොලිස් නියෝග, පොලිස් ආඥා පනතේ විධිවිධාන සහ කලින් කලට නිකුත් කරනු ලබන චක්‍රලේඛ හා උපදෙස් වලට අනුව කටයුතු කිරීම.<br><br>➢ ස්වභාවික විපත් සහ මහජන ජන ජීවිතය අනතුරට පත්විය හැකි ව්‍යසනයන් හෝ ආපදාවන් හිදී, ජීවිත හා දේපළ ආරක්ෂා කිරීම සඳහා තම උපරිම ශක්තිය හා කැපවීමෙන් කටයුතු කිරීම.<br><br>➢ ළමයින් සහ කාන්තාවන් සම්බන්ධ කටයුතු වලදී, විශේෂයෙන් කාන්තා නිලධාරිනියන් විසින් නෛතික ප්‍රතිපාදනයන්ට අනුකූලව ඔවුන්ගේ ගෞරවය හා ආරක්ෂාව සුරැකෙන පරිදි කටයුතු ඉටු කෙරෙන බවට වගබලා ගැනීම.<br><br>➢ ශ්‍රී ලංකා පොලිසියේ සහ තම ධූරයේ ප්‍රතිරූපය හා කීර්තිය ආරක්ෂා වන පරිදි සෑම විටම වෘත්තිමය භාවයෙන් කටයුතු කිරීම.<br><br>➢ පහල ශ්‍රේණිවල නිලධරයන් අධීක්ෂණය කිරීම. |
| පොලිස් පරීක්ෂක<br><br>කාන්තා පොලිස් පරීක්ෂක | ➢ ශ්‍රී ලංකා ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානයන්ට අනුව කටයුතු කිරීම මූලික අයිතීන් ආරක්ෂා කිරීම සහ නීතියේ ආධිපත්‍ය සුරක්ෂිත කිරීම.<br><br>➢ ජාතික ආරක්ෂාව, නීතිය හා මහජන සාමය සුරක්ෂිත කිරීමට අදාළ කාර්යයන් ඉටු කිරීම.<br><br>➢ පොලිස් ආඥා පනතේ 56 වගන්තිය ප්‍රකාර පොලිස් නිලධාරින් සතු වගකීම් හා යුතුකම් ඉටු කිරීම.<br><br>➢ විවිධ අණපනත් යටතේ පවරා ඇති බලතල ප්‍රකාරව කටයුතු කිරීම.<br><br>➢ සේවයේ අවශ්‍යතාවය මත පොලිස්පති හෝ බලය පවරන ලද නිලධාරීන් විසින් වරින් වර පවරනු ලබන රාජකාරි ඉටු කිරීම.<br><br>➢ ශ්‍රී ලංකා පොලිස් නියෝග, පොලිස් ආඥා පනතේ විධිවිධාන සහ කලින් කලට නිකුත් කරනු ලබන චක්‍රලේඛ හා උපදෙස් වලට අනුව කටයුතු කිරීම.<br><br>➢ ස්වභාවික විපත් සහ මහජන ජන ජීවිතය අනතුරට පත්විය හැකි ව්‍යසනයන් හෝ ආපදාවන් හිදී, ජීවිත හා දේපළ ආරක්ෂා කිරීම සඳහා තම උපරිම ශක්තිය හා කැපවීමෙන් කටයුතු කිරීම. |